# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2307/05 – 2022 නොවැම්බර් 21 වැනි සඳුදා – 2022.11.21**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2020/62.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.09.01 දිනැති හා අංක 2295/21 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2022.08.29 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් බෙලිඅත්ත, ගැටමාන්න, ඇල්දෙනිය, "සම්පත්", නො. 120/06 හි පදිංචි එච්.කේ.ආර්.එන්. ඉන්ද්‍රජිත් මයා සහ කොළඹ 01, යෝර්ක් වීදිය, නො. 02 හි පිහිටි ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හොටෙල්-හොටෙල්ස් කලම්බු (1963) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.10.25 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 නොවැම්බර් මස 04 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


1A – G 38119 – 20 (2022/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

කොළඹ බේරුම්කරණ අංශය සහ කාර්මික අධිකරණයේ දී ය

නඩු අංකය ඃ ඒ/46/2022.
ආරාවුල් අංකය ඃ IR/COM/02/2020/62.

එච්.කේ.ආර්.එන්. ඉන්ද්‍රජිත් මයා
නො. 120/6, "සම්පත්"
ඇල්දෙනිය, ගැටමාන්න,
බෙලිඅත්ත.

එරෙහිව,

ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හොටෙල්,
හොටෙල්ස් කලම්බු (1963) ලිමිටඩ්,
නො. 02, යෝර්ක් වීදිය,
කොළඹ 01.

වර්ෂ 2022 ක් වූ ඔක්තෝබර් මස 25 වැනි දින දී ය.

## ප්‍රදානය

ගරු කම්කරු අමාත්‍ය, මනුෂ නානායක්කාර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණ පනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ආරවුල පිළිබඳ කම්කරු කොමසාරිස්වරයාගේ යොමුව පරිදි කම්කරු ආරවුලට හේතු වී ඇති කරුණ වනුයේ,

"එච්.කේ.ආර්.එන්. ඉන්ද්‍රජිත් මයා, නො. 120/6, "සම්පත්", ඇල්දෙනිය, ගැටමාන්න, බෙලිඅත්ත සහ ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හොටෙල්, හොටෙල්ස් කලම්බු (1963) ලිමිටඩ්, නො. 02, යෝර්ක් වීදිය, කොළඹ 01 අතරෙ පැවති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ එච්.කේ.ආර්.එන්.ඉන්ද්‍රජිත් මහතාගේ වැඩ තහනම් කරන ලද 2017.05.30 දින සිට නැවත රැකියාව ලබා දුන් 2017.11.06 වන දින දක්වා කාලයට අදාල වැටුප නොගෙවීම තුළින් ඒ මහතාට අසාධාරණයක් සිදුවී තිබේ ද, තිබේ නම් ලැබිය යුතු සහනයක් මොනවාද යන්න වේ."

ඉහත ආරවුල මා වෙත පිරිනැමූ අතර එය 2022.10.06 වන දින සහ 2022.10.25 වන දින බේරුම්කරණයට යොදා ගත් අතර අවසන් දිනය වන අද දින එනම් 2022.10.25 වන දින ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හොටෙල් මානව සම්පත් කළමණාකාර තුමා ඒ වැටුප අහිමි වූ මාස 05 වැටුප පමණක් ගෙවීමට කැමැත්ත පළ කර ලිපියක් කාර්මික අධිකරණය වෙත ඉදිරිපත් කළේය. ඒ අනුව ඉන්ද්‍රජිත් මහතා හා සාකච්ඡා කළ අතර ඔහු එම ගෙවීම ලබා ගැනීමට කැමැත්ත පළ කර සිටී.

"එච්.කේ.ආර්.එන්. ඉන්ද්‍රජිත් මහතාගේ වැඩ තහනම් කරන ලද 2017.05.30 වන දින සිට නැවත රැකියාව ලබා දුන් 2017.11.06 වන දින දක්වා කාලයට අදාල වැටුප නොගෙවීම තුළින් ඒ මහතාට අසාධාරණයක් සිදු වී තිබේ. ඒ අනුව ඒ මහතාගේ මාසික වැටුප රුපියල් 18,700X5= රුපියල් 93,500ක මුදලක් 2022 නොවැම්බර් මාසයේ වැටුප ගෙවන දින තුළ සිට දින 14ක් තුළ ගෙවා 2022.12.10 දින හෝ ඊට පෙර සහකාර කම්කරු කොමසාරිස් දකුණු කොළඹ වෙත අදාල ගෙවීම් වවුචර් පත් ඉදිරිපත් කරන ලෙස නියෝග කරමි.

මෙය සාධාරණ සහ යුක්ති සහගත තීරණයක් බව සහතික කරමි.

රවීන්ද්‍ර ලාල් ගුණවර්ධන,
බේරුම්කරු

2022 ඔක්තෝබර් මස 25 වැනි දින දී ය.

EOG 11-0233

මගේ අංකය: IR/COM/01/2018/291.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2020.03.10 දිනැති හා අංක 2166/8 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2020.02.24 වැනි දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මාලබේ, තලංගම උතුර, පොතුඅරාව, අංක 1049/7 හි පදිංචි බී. චන්ද්‍රපාල පෙරේරා මයා සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.09.09 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 නොවැම්බර් මස 04 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය**

බේරුම්කරු ඩී.ජී.කේ. කරුණාරත්න මහතා ඉදිරිපිටදීය.
නඩු අංකය : A/09/2020.
ආරාවුල් අංකය : IR/COM/01/2018/291.

බී. චන්ද්‍රපාල පෙරේරා මයා
අංක 1049/7,
පොතුආරාව,
තලංගම උතුර,
මාලබේ.

පළමු පාර්ශවය,

සහ,

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200,
කිරුළ පාර,
කොළඹ 05.

දෙවන පාර්ශවය,

අතර පවතින කාර්මික ආරාවුල.

නිපුණතා සංවර්ධන රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මා පත්කොට මා වෙත යොමුකර ඇත.

ආරාවුල පිළිබඳ කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ යොමුව පහත පරිදි වේ,

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කළ බී.සී. පෙරේරා මහතාට ස්වේච්ඡා විශ්‍රාම යාමේදී ගෙවනු ලැබූ වන්දි හා පාරිතෝෂික මුදල ගණනයේදී අසාධාරණයක් සිදුවී තිබේද? එසේ අසාධාරණයක් සිදුවී ඇත්නම් කුමන සහනයක් හිමිවිය යුතුද?" යන්න පිළිබඳ වේ.

මෙයට අදාළ කාර්මික ආරවුලට හේතු වී ඇත්තේ

I. සිය කැමැත්තෙන් විශ්‍රාම යන අයට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ 2016 අංක 1 චක්‍රලේඛය අනුව වන්දි මුදල් ප්‍රදානය කිරීමේදී වෘත්තීය දීමනාව වශයෙන් ගෙවූ රු. 7500ක මුදල පාරිතෝෂික මුදලට එක් නොකිරීම නිසා එහි හිඟ මුදල නොලැබීම හා එහි අධිභාරය අහිමිවීම.
II. ඉහත චක්‍රලේඛය අනුව වැටුප් වර්ධක ගණනය නොකිරීම නිසා එහි හිඟ මුදල නොලැබීම.

යන ප්‍රධාන කරුණු වේ.

පෙනී සිටීම

| | |
|---|---|
| පළමු පාර්ශවය වෙනුවෙන් | නියෝජිත එම්.කේ. හේමපාල මහතා |
| දෙවන පාර්ශවය වෙනුවෙන් | නීතී නිලධාරිනි<br>නීතීඥ පී.ඒ.ඩී.ඩී. පනංගල මහත්මිය<br>නීතීඥ රුවිරාණි ජයකොඩි මහත්මිය<br>නීතීඥ ගංගානි උක්වත්ත මහත්මිය<br>නීතීඥ කසීලා කබීර් මහත්මිය |

පළමු පාර්ශවය විසින් සිය පළමු ප්‍රකාශය ගොනු කිරීමෙන් අනතුරුව දෙවන පාර්ශවය විසින් පිළිතුරු ප්‍රකාශය ඉදිරිපත් කර තිබුණි. පළමු පාර්ශවය විසින් ප්‍රතිඋත්තර ප්‍රකාශය ඉදිරිපත් කර ඇත.

මෙම නඩු විභාගය 2020.11.09 දින ආරම්භ කොට 2022.08.01 වන දින අවසන් කරන ලදී. මේ සඳහා වසර දෙකක පමණ කාලයක් ගතවීමට හේතු වූයේ කොවිඩ් වසංගත තත්වය නිසා රට වසා දැමීම, එම හේතුවෙන් වරින්වර කාර්යාල වසා තැබීම හා ඉල්ලුම්කරු සැත්කමකට භාජනය වීම නිසා දිගු දිනයක් ඉල්ලුම් කිරීම යන කරුණු මතය.

පලමු පාර්ශවය විසින් සිය ලිඛිත දේශණ 2022.08.01 ලබා දුන් අතර දෙවන පාර්ශවය ඊට දින පහකට පසු තම ලිඛිත දේශණ භාරදෙන ලදී.

## ප්‍රදානය

**පළමු පාර්ශවයේ ඉල්ලීම**

පලමු පාර්ශවය විසින් දිගින් දිගටම ඉල්ලා සිටියේ දිගුකලක් ගමනාගමන මණ්ඩලයේ සේවය කොට සිය කැමැත්තෙන් විශ්‍රාම යන සේවකයන්ට අදාල හිමිකම් වරප්‍රසාද ලබානොදීමෙන් වන්දි ගණනය කිරීමේදී වගඋත්තරකාර ආයතනය විසින් ඉල්ලුම්කරුට බලවත් මූල්‍යමය අලාභයක් සිදුකර ඇති බවයි. තවද එවැනි හිමිකම් වරප්‍රසාද ලබා නොදෙන්නේ නම් ඊට අදාල චක්‍රලේඛයේ ඒ බව සඳහන් නොකිරීමෙන් වරදක් කළ බවයි.

**දෙවන පාර්ශවයේ පිළිතුර**

පවත්නා චක්‍රලේඛ වලට අනුව ස්වේච්ඡා වන්දි ක්‍රමය යටතේ ඉවත් වූ ඉල්ලුම්කරුට වන්දි මුදල් නිසියාකාරව ගෙවා ඇති බවත් ඒ මුදල් ඉල්ලුම්කරු භාරගෙන ඇති නිසාත් ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදු නොකල බවයි.

මෙම බේරුම්කරණයේදී පලමු පාර්ශවය වෙනුවෙන් 2021.03.15 වන දින ඉල්ලුම්කරු වන බී. චන්ද්‍රපාල පෙරේරා මහතාගෙන් සාක්ෂි මෙහෙයවන ලදී. ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් තමා මෙහි ඉල්ලුම්කරු බවත් 1977.12.21 දින ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට සේවයට බැඳී 2016.11.30 වන දින විශ්‍රාම ගොස් සිටින බවත් මේ වන විට අවුරුදු 38 සේවා කාලයක් සපුරා ඇති බවත් මුලදී බැඳුනේ 5 වන පන්තියේ කම්කරු තනතුරට බවත් ප්‍රකාශ කර සිටී. තම පත්වීම 1978 ජුනි 22 ස්ථිර කල බවත් 1993.01.25 දින

තුන්වන පෙල සහාය කාර්මික තනතුරට පත්වූ බවත් නවවන ශ්‍රේණියේ ඩිපෝමාර්ග පරීක්ෂක තනතුරට 1988.06.15 දින පත්වූ අතර 1989.02.09 දින සිට VII A ශ්‍රේණියේ ඩිපෝ මාර්ග පරීක්ෂක තනතුර හිමිකරගත් බවත් 1991.08.25 දින සිට සහකාර ධාවන ගමනාගමන තනතුරට පත්වූ බවත් 2002.08.05 දින සිට IV වන ශ්‍රේණියේ නිලධාරි තනතුර ලැබූ බවත් 2022.12.01 දින සිට III B සහකාර කළමනාකරණ ධාවන තනතුරට පත්වූ බවත් සිය සාක්ෂියෙන් අනාවරණය කර සිටී.

2015.03.01 දින සිට දෙවන ශ්‍රේණියේ ප්‍රධාන ජංගම කළමණාකරණ තනතුරට පත්වූ අතර විශ්‍රාම යන අවස්ථාවේදී එම තනතුර දරූ බවත් අදාල ලේඛන ඉදිරිපත් කරමින් තම සාක්ෂිය තහවුරු කරයි. ඉ/09 ලේඛණය අනුව තම තනතුරු ස්ථිර කර ඇති බවද කියා සිටී. වගඋත්තර පාර්ශවය ඉහත සඳහන් සාක්ෂිය අභියෝගයට ලක්කර නැත. 2020.08.18 දින නීතීඥ දිමුතු පනංගල මහත්මිය විසින් ඉදිරිපත් කල පිළිතුරු ප්‍රකාශයෙන් ඉල්ලුම්කරු දරූ තනතුර පිළිගෙන ඇත.

තමාට වයස අවුරුදු 60 වනතුරු සේවය කල හැකි වුවත් වයස අවුරුදු 59න් විශ්‍රාම ගියේ සේවකයන්ට සිය කැමැත්තෙන් විශ්‍රාම යාම සඳහා ගමනාගමන මණ්ඩලය විසින් 2016 අංක III හා 2016 අංක 1 දරන චක්‍රලේඛය නිකුත්කර තිබීම අනුව ක්‍රියාකල බව තවදුරටත් සාක්ෂි දෙමින් කියා සිටී. වගඋත්තර ආයතනයේ ඉ/10, ඉ/12 දරණ චක්‍රලේඛ අනුව තමා සිය කැමැත්තෙන් විශ්‍රාම යාමට කැමති බව ප්‍රකාශ කල බවද තවදුරටත් කියා සිටී.

ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්ණ විමසීමේදී ඊට පිළිතුරු දෙමින් මෙසේ ප්‍රකාශ කර සිටී. "ඒ අනුව අංක 01 වසරකට සති දෙකක් පාරිතෝෂිකය දෙන බවට යන වගන්තිය පිළිනොගන්න කියා මම ඉල්ලුම් කලේ නැහැ. පසුව 2016 අංක 03 දරන චක්‍රලේඛයේ සංශෝධනයක් වශයෙන් අවුරුද්දකට මාසයක පාරිතෝෂිකය දෙනවා කියල. ඊට පසු මම 3 වන චක්‍ර ලේඛයට අනුව අයදුම්පතක් ඉදිරිපත් කලා."

(සාක්ෂි සටහන් 159 පිටුව) එම 2016 - III ඊ/12 ලෙස III වන චක්‍රලේඛය ඉදිරිපත් කර ඇත. ඊ/12 01 (I) හි අවසන් වරට ලැබූ වැටුප/වේතනය පදනම් කරගෙන මුල් පත්වීමේ දින සිට සේවය අවසන් කිරීම දක්වා එක් වර්ෂයකට එක් මසක වැටුප බැගින් ආගණනය කර පාරිතෝෂිකය ගෙවිය යුතුය යනුත් සඳහන් වේ. ඊ/10 චක්‍රලේඛයේ (2016 අංක 1 දරන චක්‍රලේඛයේ) 03 වන කොටසේ මෙසේ සඳහන් වන බව ඉල්ලුම්කරු නැවත විමසීම් වලට පිළිතුරු දෙමින් කියා සිටී.

"අවසාන වශයෙන් විශ්‍රාම ගන්නා අවස්ථාවේදී ලබාගත් සියලුම දීමනාව ඇතුළු මාස 06 වැටුප පමණකි" වයස අවුරුදු 55-59 දක්වා සේවකයෝ සිටින සේවකයෙකු වශයෙන් තමාට එයට හිමිකම් තිබුණත් තමාට එය නොලැබුනු බව පවසා සිටී.

මෙම චක්‍රලේඛ දෙකෙන් එකකවත් සඳහන් කර තිබුණ ද තමාට ලබාදුන් රු. 7500.00 දීමනාව නොගෙවන බවට යනුවෙන් නැවත විමසීම් වලදී නැගූ ප්‍රශ්ණයට ඉල්ලුම්කරු "සඳහන් කර තිබුණේ නැහැ" යනුවෙන් පිළිතුරු දෙයි.

වගඋත්තරකාර ආයතනය වෙනුවෙන් සාක්ෂි දුන් ප්‍රධාන කළමණාකරු කියා සිටියේ රු. 7500.00 දීමනාව අභ්‍යන්තර දීමනාවක් මිස ව්‍යවස්ථාපිත දීමනාවක් නොවන බවයි. එම දීමනාව සභාපතිතුමා විසින් ලබාදුන් බවත් එම දීමනා වන්දි මුදල් ගණනය කිරීමට හෝ පාරිතෝෂික මුදල් ගණනය කිරීම් අදාල කර නොගන්නා බවත්ය. (සාක්ෂි සටහන් 104 පිටුව එහෙත් ඉ/10 හා ඉ/12 චක්‍රලේඛවල සඳහන් කර ඇත්තේ විශ්‍රාම ගන්නා විට ලබාගත් සියලු දීමනා ගණන් ගන්නා ලෙසටය. මෙම චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව මෙම වන්දි මුදල් ප්‍රදානය කර ඇති බවට නිගමනය කරමි.

ඉල්ලුම්කරු අවසාන වශයෙන් 2016 නොවැම්බර් මාසයේ ලැබූ රු. 57726.00 බව සාක්ෂිකරු හරස් ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් පිළිගනී. ඉ/10 චක්‍ර ලේඛය අනුව මාස 06කට ලැබිය යුතු මුදල රු. 346356.00 විය යුතුය. ඒ අනුව වන්දි මුදල ගෙවා නැති බව සාක්ෂිකරු පිළිගනී. (සාක්ෂි සටහන් 116 පිටුව) ඉල්ලුම්කරුට විශේෂ වාර්තා වැටුප් 4ක් හිමිවිය යුතු බව ඉල්ලුම්කරු කියා සිටින්නේ ඉ/15 ඉදිරිපත් කරමින් ඉල්ලුම්කරු සාක්ෂිදෙමින් කියා සිටින්නේ

ප්‍ර: මේ රු. 7500.00 රහිතව වන්දි ගණනය කරන්න කිව්වා නම් තමන් කැමැත්ත ප්‍රකාශ කරනවාද?
පි: කැමැත්ත ප්‍රකාශ කරන්නේ නැහැ
ප්‍ර: ඒ රු. 57726.00 ට රු. 7500.00 එකතු කරලා තිබුණේ නැහැ?
පි: එහෙමයි ස්වාමීනි
තවදුරටත් ඉල්ලුම්කරු සාක්ෂි දෙමින් කියා සිටින්නේ

ප්‍ර: පාරිතෝෂික දීමනාව සහ එම දීමනාව එම දීමනාව ගණනය කරන්නේ නැති බව සඳහන් කලා නම් තමන් මේ චක්‍රලේඛය අනුව සේවයෙන් ඉවත්වන්න කැමැත්ත ප්‍රකාශ කරනවාද?

පි: නැහැ ස්වාමීනි (සාක්ෂි සටහන් 197/198 පිටු)

ප්‍ර: සේව්‍යයාගෙන් ලෙස පිරිනමන වාර්ෂික වැටුප් වර්ධක තමන්ගේ වන්දි මුදලට සහ පාරිතෝෂික මුදලට එකතු කර ගෙවන්නේ නැහැ කියලා මේ චක්‍රලේඛයේ සඳහන් වූවානම් සේවකයන් ඉවතට යාමට තමන් කැමැත්ත ප්‍රකාශ කරනවාද? වන්දි ක්‍රමය යටතේ

පි: නැහැ ස්වාමීනි

ප්‍ර: එබැවින් තමන් ගරු අධිකරණයෙන් ගෞරවයෙන් අයැද සිටින්නේ කුමන සහනයක්ද?

පි: මට අහිමි වුන මුදල් ලබාගැනීමේ සහනය

ප්‍ර: මොනවාද ඒ සහනයන්?

පි: මාස 06කට අඩුවෙන් ගෙවන ලද මුදල මාසයකට රු. 7500 බැගින් මාස 06ට රු. 45000.00 ත් සේවා පාරිතෝෂිකය මුදලට රු. 7500.00 බැගින් නොගෙවන ලද මුදලේ එකතුව රු. 285000.00ත් වාර්ෂික වැටුප් වර්ධක ගණනය කොට වන්දි සහ පාරිතෝෂික දීමනා නොගෙවීම නිසා සිදුවන රු. 2940.00 ක මුදලත් ලබාගැනීමට මා අයැද සිටී. (සාක්ෂි සටහන් පිටුව 199)

වග උත්තරකාර ආයතනය වෙනුවෙන් සාක්ෂි ලබාදුන් ප්‍රධාන මූල්‍ය කළමණාකාර මහතා සාක්ෂි දෙමින් කියා සිටියේ ඉල්ලුම්කරුට වන්දි මුදල නිසි අයුරින් ගෙවන ලද බවයි. මූල්‍ය කළමණාකරණ හරස් ප්‍රශ්ණ වලට පිළිතුරු දෙමින් කියා සිටියේ තමන් මේ ගැන නොදන්නා බවයි.

ප්‍ර: ඒ අයදුම්පත්‍ර ඉදිරිපත් කරන සේවකයන්ට ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගැන්වීමේදී හිමිවන සෑම දෙයක්ම එහි සඳහන් කළ යුතුව තිබෙනවාද?

පි: මම ප්‍රධාන මූල්‍ය කළමණාකාර. මේ නියෝජ්‍ය කළමණාකාර සාමාන්‍යාධිකාර පාලන පැත්තෙන් හදපු සර්කියුලර් එකක්. එතකොට මගෙන් අහනවා මේක සම්පූර්ණ වෙන්න ඕනද කියලා. ඒකට මට පිළිතුරක් දෙන්න බැහැ. මගේ තනතුරින් ඒකට පිළිතුරක් දෙන්න බැහැ. (සාක්ෂි සටහන් 120 පිටුව)

ඉල්ලුම්කාර ඇසූ මෙම ප්‍රශ්ණයට සාක්ෂිකරු පිළිතුරු නොදී මඟහැරියා. මේ සඳහා අදාල වෙනත් නිලධාරියෙකු සාක්ෂියට වගඋත්තර පාර්ශවය ඉදිරිපත් කලේ ද නැත. එසේ නම් සිය කැමැත්තෙන් විශ්‍රාම යන අයට ලැබිය යුතු සියල්ල චක්‍රලේඛය මගින් දැනුම් දීම වගඋත්තර පක්ෂයේ වගකීමකි.

පරිපාලන අංශයට අදාල ලිපි ලේඛන ගැන සාක්ෂිකරු නොදන්නා බැවින් ඊට අදාලව නි. සාමාන්‍යාධිකාරී (පාලන) හෝ එහි ප්‍රධානියා ව කැඳවන ලෙසට සාක්ෂිකරු යෝජනා කර සිටී. එහෙත් වගඋත්තර පක්ෂය විසින් අදාල අය කිසිවෙකු සාක්ෂි සඳහා ඉදිරිපත් කලේ නැත.
බේරුම්කරු මෙම නඩුව 2022.06.30 වන දින කැඳවූ අවස්ථාවේදී වගඋත්තර පාර්ශවයේ නීති නිලධාරිනි දිමුතු පනංගල මහත්මිය කියා සිටියේ වගඋත්තර පාර්ශවය වෙනුවෙන් වෙනත් සාක්ෂි නොකැඳවන බවත් නඩුව අවසන් කරන බවත් ලිඛිත දේශණ සති 03ක් ඇතුළත ලබාදීමට ඉල්ලා සිටින ලදී. ඒ අනුව මෙම නඩුව 2022.06.30 අවසන් කළ අතර ලිඛිත දේශණ ලබාදීම සඳහා 2022.07.29 වන දින පෙ.ව. 10.00 ලබාදෙන ලෙසට නියම කරන ලදී.

ඉල්ලුම්කාර පාර්ශවය විසින් සිය ලිඛිත දේශණ අවසානයේදී ඉල්ලා සිටින ලද නොගෙවන ලද මුදල් මෙසේ සඳහන් කර ඇත.

(අ) රු. 7500.00 තනතුරු දීමනාව මාස 6 හිඟ මුදල වන රු. 45000.00

(ආ) විශේෂ වැටුප් වර්ධක 4 (735.00X4) රු. 2940.00

(ඇ) රු. 7500.00 දීමනාව සේවා පාරිතෝෂික මුදල සේවා කාලය වසර 38 (7500.00X38) රු. 285000.00 මුදල හා ඊට 30% අධිභාරය වූ රු. 85500.00 මුදල

වගඋත්තර පක්ෂය ඉදිරිපත් කල R 9 (a) ලේඛණ අනුව සිය කැමැත්තෙන් විශ්‍රාම යන අයට වැටුප් වර්ධක නොලැබෙන බැවින් ඉහත (ආ) කොටස් ඉල්ලීම ලබා දීමට නියෝගකල නොහැක.

මෙම බේරුම්කරණ අධිකරණයට මෙම නඩුව ඇසීමට බලයක් නොමැති බව (සාක්ෂි සටහන් 151 පිටුව) හා ඉදිරිපත් කල ලිඛිත දේශණ අවසන් පිටුව (262 පිටුව) සඳහන් කර ඇත. මෙයට පිළිතුරු වශයෙන් ඉල්ලුම්කාර පක්ෂය කියා සිටින්නේ මෙම පැමිණිල්ල කම්කරු කොමසාරිස් වරයා විසින් වසරකට වැඩි කලක් විභාග කිරීමෙන් අනතුරුව එහිදී ලබාදුන් නියෝග ක්‍රියාත්මක නොකිරීම නිසා බේරුම්කරණ අධිකරණයට යොමුකල බවයි.

කම්කරු කොමසාරිස් වරයා බේරුම්කරු මගින් අසා ඇත්තේ සිය කැමැත්තෙන් විශ්‍රාම යාමේදී ඉල්ලුම්කරුට වන්දි හා පාරිතෝෂික

නොදී අසාධාරණයක් සිදුව ඇතිවද? යන්නයි. ඉල්ලුම්කරුට අසාධාරණයක් වී ඇත. මෙම නඩුවේ ඇසීමේ බලයක් බේරුම්කරණ අධිකරණයට නොමැති බව වගඋත්තර පාර්ශවය විරෝධයක් දක්වූවත් මෙය බේරුම්කරණයක් වන හෙයින් මෙම නඩුව විභාග කිරීමට නීතිමය බාධාවක් නොමැති බැවින් වගඋත්තර පාර්ශවයේ විරෝධය ප්‍රතික්ෂේප කරමින් මෙම නඩුව දිගටම පවත්වාගෙන යන ලදී. ඒ අනුව ඉල්ලුම්කරුට ගෙවන ලද පාරිතෝෂික මුදලේ අඩුවක් ඇති බැවින් එය ලබාගැනීම සඳහා බලයක් නොමැති බවට එම පනතේ සඳහන් කර නොමැති බැවින් මෙම නඩුව පවත්වාගෙන යන ලදී.

මෙම වන්දි ප්‍රදානයේදී ඉල්ලුම්කරුට අසාධාරණයක් වී ඇති බැවින් මෙම මුදල වන රු. හාරලක්ෂ පහලොස්දහස් පන්සියය (රු. 415500.00) බේරුම්කරණ නඩුවේ පළමුවන පාර්ශවය වන බී. චන්ද්‍රපාල පෙරේරා මහතාට ලබාගත හැකිවන පරිදි මෙම නියෝගය ගැසට් පත්‍රයේ පල කරන දිනයේ සිට දින 14ක් ඇතුලත නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කරන ලෙසට මෙයින් නියම කරමි. තවද මෙම ප්‍රදානය *ගැසට් පත්‍රයේ* පල කරන ලද දින සිට මසක් ඇතුලත ක්‍රියාත්මක කර ඒ බව නැගෙනහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත දැනුම් දිය යුතු බවට මෙයින් නියම කරමි.

තවද ඉල්ලුම්කරු ට හිමි සේවක අර්ථසාධක හා අනෙකුත් දීමනා සම්බන්ධයෙන් කම්කරු කොමසාරිස්තුමා වෙත ඉල්ලුම් කිරීමට මෙම ප්‍රදානය බාධාවක් නොවේ.

මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවද සටහන් කරමි.

නීතිඥ ඩී.ජී.කේ. කරුණාරත්න,
බේරුම්කරු

2022 සැප්තැම්බර් මස 09 වැනි දින දී ය.

EOG 11-0234

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.